# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1777/36 - 2012 සැප්තැම්බර් මස 28 වැනි සිකුරාදා - 2012.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

### නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත් කිරීම්

නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර මොහාන් විජේවික්‍රම වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154එෆ්(1)(4) සහ (5) වැනි වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත සඳහන් පත් කිරීම් කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

| | |
|---|---|
| ගරු අබ්දුල් මජීඩ් මොහොමඩ් නජීබ් මැතිතුමා | - මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පරිපාලන, මිනිස් බල, පළාත් පාලන, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම, ග්‍රාමීය සංවර්ධන සහ පාරිසරික කටයුතු අමාත්‍යවරයා වශයෙන් 2012ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින සිට |
| අමාත්‍යාංශ ලේකම් වශයෙන් | - යූ. එල්. ඒ. අසීස් මහතා - ශ්‍රී. ලං. ප. සේ. - විශේෂ ශ්‍රේණිය |
| ගරු අහමඩ් නසීර් සයිනුලබ්ඩීන් මැතිතුමා | - කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන, ධීවර කටයුතු සහ සංචාරක අමාත්‍යවරයා වශයෙන් 2012ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින සිට |
| අමාත්‍යාංශ ලේකම් වශයෙන් | - කේ. පත්මනාදන් මහතා - ශ්‍රී. ලං. කෘ. සේ. - I ශ්‍රේණිය |
| ගරු දිසානායක විමලවීර මැතිතුමා | - අධ්‍යාපන, සංස්කෘතික කටයුතු, ඉඩම් සහ ඉඩම් සංවර්ධන හා ප්‍රවාහන කටයුතු අමාත්‍යවරයා වශයෙන් 2012ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින සිට |
| අමාත්‍යාංශ ලේකම් වශයෙන් | - එන්. ඒ. ඒ. පුෂ්පකුමාර මහතා - ශ්‍රී. ලං. ප. සේ. - I ශ්‍රේණිය |
| ගරු මීරා සයිබු උදුමා ලෙබ්බේ මැතිතුමා | - මාර්ග සංවර්ධන, වාරිමාර්ග, නිවාස හා ඉදිකිරීම්, ග්‍රාමීය විදුලිය හා ජල සම්පාදන කටයුතු අමාත්‍යවරයා වශයෙන් 2012ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින සිට |
| අමාත්‍යාංශ ලේකම් වශයෙන් | - ඒ. එච්. එම්. අන්සාර් මහතා - ශ්‍රී. ලං. ප. සේ. - විශේෂ ශ්‍රේණිය |
| ගරු ඉබ්‍රාහිම් මොහොමඩ් මොහොමඩ් මන්සූර් මැතිතුමා | - සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, වනිතා කටයුතු, යෞවන කටයුතු, ක්‍රීඩා, තොරතුරු තාක්ෂණ අධ්‍යාපන, සමුපකාර සංවර්ධන, ආහාර සැපයුම් හා බෙදා හැරීමේ කටයුතු අමාත්‍යවරයා වශයෙන් 2012ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින සිට. |
| අමාත්‍යාංශ ලේකම් වශයෙන් | - ආචාර්ය එස්. අමලනාදන් මහතා - ශ්‍රී. ලං. ප. සේ. - විශේෂ ශ්‍රේණිය |

මොහාන් විජේවික්‍රම,
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

10-602


1A - PG 001396 — 345 (2012/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.